**පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය**

நிருவாகத்துக்கான பாராளுமன்றஆணையாளர் அலுவலகம் (ஒம்புட்ஸ்மன்)

**OFFICE OF THE PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION**

**(Ombudsman)**

පළමු මහල, අංක:14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ 04.

முதலாவது மாடி, இல -14 ஆர்.ஏ.டி மெல் மாவத்தை, கொழும்பு - 04.

First Floor, No: 14 R.A.De Mel Mawatha, Colombo 04, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office 011-2588798

ෆැක්ස් / பக்ஸ் / Fax 011-2501126

පරිපාලන නිලධාරී / நிருவாக உத்தியாகத்தர் / Administrative Officer 011-2585896

E-mail: ombudssl@gmail.com


---

මගේ අංකය: / எனதுஇல: / My No: RTI/Report

ඔබේ අංකය: / உமது இல: / Your No:

දිනය: / திகதி: / Date 2021.01

**පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත මගින් සපයන ලද තොරතුරු පිළිබඳ වාර්ෂික විශ්ලේෂණය - 2020**

**අ) වර්ෂය තුළදී ලැබුණු මුළු ඉල්ලීම් ගණන සහ සපයන ලද සහ ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ප්‍රමාණය**

මුළු ඉල්ලීම් ගණන - 5

සපයන ලද තොරතුරු ගණන - 5

ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ගණන - 3

**ආ) වර්ෂය තුලදී එකතු කරනු ලැබු ගාස්තු ගණන**

ගාස්තු අයකර නොමැත

**ඇ) 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන**

ඉල්ලීම් 3ක් ප්‍රතික්ෂෙප කර ඇත.

**ඈ) කොමිෂන් සභාවේ විධිවිධාන පරිදි තොරතුරු සපයන ලද වාර ගණන**

-

**ඉ) විනිවිධභාවය පිළිබඳ පවත්නා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යම් යෝජනා**

-

**ඊ) තොරතුරු සන්නිවේදනය කිරීම, ප්‍රතික්ෂේප කිරීම මගින් පැන නගින අභියාචන සංඛ්‍යාව**

අභියාචනා 1ක් පැමිණ ඇත.

**උ) වාර්තා පවත්වාගෙන යෑම, කළමනාකරණය සහ විනාශ කිරීමට අදාළ පරිචයන්**

2011.12.31 දින විවෘත කළ නිර්දේශ ලබා දී වැඩ අවසන් ගොනු අපහරණය කර ඇත. තොරතුරු පනත ක්‍රියාත්මක දින වන විට අප භාරයේ පවතින 2012.01.01 දින සිට විවෘත කළ සියලු ගොනු විධිමත් පරිදි ගබඩා කර පවත්වාගෙන යනු ඇත. එදින සිට වසර 10කට පසුව අපහරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

**ඌ) 8 වන වගන්තිය යටතේ ස්වකීය කර්තව්‍යයන්**

රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, පළාත් සභා හෝ වෙනත් එවැනි ආයතනයක නිලධාරීන් විසින් සිදු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හෝ ඒ හා සමාන අසාධාරණකම් පිටුදැකීම අරමුණු කරගෙන, පොදු මහජනතාව විසින් සෘජුවම ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලිවලට අදාලව විමර්ශනයන් සිදුකර ඉන් අනතුරුව, දෝෂ සහිත පරිපාලනමය තීරණයන් ඇතොත්, ඒවා ආපසු හරවමින් වෙනස් කරලීම සඳහා ඉල්ලා සිටීම හෝ ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සහ/හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම කරනු ලබයි.

තවද, ඉහත ඡේදයේ සඳහන් ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට අදාලව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලබන පැමිණිලි, අප ආයතනයේ කාර්යභාරය තුලට ඇතුලත් වන්නේ නම්, ඒවාද විමර්ශනය කර ඒ අනුව උචිත තීරණ වලට එළඹීම ද අපගේ ක්‍රියාකාරකම් වලට ඇතුලත් වේ.

මේ අනුව අප ආයතනයේ ප්‍රධාන කාර්යය වනුයේ රටේ පවත්නා නීතියට හා ඒ යටතේ සාදා ඇති රෙගුලාසි හා රීතින් වලට අනුකූලව කටයුතු කරමින්, ශ්‍රී ලංකා රාජ්‍ය තුල පවතින පරිපාලන යන්ත්‍රය නිවැරදි මඟකට යොමු කරමින් කටයුතු කරන අතරම, මහජනතාවගේ කඩවී ඇතැයි කියනු ලබන අයිතිවාසිකම් වලට අදාල තීරණ නිවැරදි කරමින් ජනතාවට සහන සැලසීමයි.

**<u>සේවාලාභීන්</u>**

මින් පෙර සඳහන් කරන ලද නිලධාරීන්ගේ තීරණ හේතුවෙන් අසාධාරණයට ලක් වූ මහජනතාව, සේවාලාභීන් වේ. අවසාන වශයෙන්, අපගේ ප්‍රයත්නය වනුයේ රටේ සමස්ථ පරිපාලන ක්‍රමයේ ප්‍රමිතිය ඉහල නැංවීමයි.

තොරතුරු නිලධාරී,
එච්.පී.අනුලා පතිරණ
පරිපාලන නිලධාරිනි
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්
(ඔම්බුඩ්ස්මන් ) කාර්යාලය